# ඛුද්දකපාඨය හා භික්ෂුව

සියඹලාගහවැටියේ සුමනාලංකාර හිමි ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය, සූත්‍ර - විනය - අභිධර්ම - වශයෙන් පිටක තුනකට බෙදුණි. සූත්‍ර පිටකයට අයත් ග්‍රන්ථ පහක් ගැන පාලි සාහිත්‍යයෙහි සඳහන් වෙයි. එම පොත් පහ රචනා වූයේ නිකාය ග්‍රන්ථයන් වශයෙනි. නිකාය ග්‍රන්ථ පහ, පාලි සාහිත්‍යයේ මෙසේ සඳහන් වෙයි.

1. ඛුද්දක නිකාය
2. දීඝ නිකාය
3. මජ්ඣිම නිකාය
4. සංයුක්ත නිකාය
5. අංගුත්තර නිකාය වශයෙනි. එසේ සංග්‍රහ කරන ලද නිකාය ග්‍රන්ථයන් පස අතුරෙන් ඛුද්දක නිකාය හැර අනිකුත් නිකාය ග්‍රන්ථ හතර එක්තරා රටාවකට අනුව සැකසී ඇත. මෙසේ හෙයින් ඛුද්දක නිකායෙහි එබඳු ස්වරූපයක් දක්නට නොමැත. එකල ග්‍රන්ථ කරණයක් නොවූ හෙයින් නිකාය ග්‍රන්ථයන් එක් එක් පරම්පරාවට භාර කළ බවක් සඳහන් වේ එම පරම්පරාවෙන් දීඝ භාණක - මජ්ඣිම භාණක - සංයුත්ත භාණක - අංගුත්තර භාණක වශයෙන් ව්‍යවහාර කරන්නට යෙදුණි. ඛුද්දක නිකායේ ඇතැම් ග්‍රන්ථවලට පමණක් භාවිතයෙන් සිටි බව පෙනේ ප්‍රථම ධර්ම සංගීතියේදී ඛුද්දක නිකාය සංග්‍රහ වී යැයි ඇතැම් විචාරකයෝ පිළි නොගනිති. බොහෝ උගතුන් එය පසුකාලීනව සකස් කරන්නට ඇතැයි විශ්වාශ කළ බවක් පෙනේ.

නිකාය ග්‍රන්ථයන්ගේ ආරම්භය ප්‍රථම ධර්ම සංගීතියයි. මේ නිසා ප්‍රථම ධර්ම සංගීතියත් බුද්ධඝෝෂ සමයත් අතර කාලයේ දී ඛුද්දක නිකාය සකස්වන්ට ඇතැයි විශ්වාශ කෙරේ. බුද්ධඝෝෂ හිමියන් විසින් විරචිත සමන්තපාසාදිකා වේ එයට කදිම නිදසුනකි. බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද සමන්තපාසාදිකාව නම් වූ විනය අටුවාවෙහි මෙසේ සඳහන් වෙයි.

ඨපෙත්වා චතුරො පෙතෙ
නිකායෙ දීඝ ආදිතෙ
තදඤ්ඤං බුද්ධං වචනං
නිකායො ඛුද්දකොෆ්මතො - මේ ගාථාවට අනුව එකල පැවතියේ මුල් නිකාය හතර බවත් එයින් අන්‍ය වූ නිකාය :- ඛුද්දක නිකාය බවත් සඳහන් කරයි. බුද්ධඝෝෂ හිමියන්ගෙන් පසුව ඛුද්දක නිකාය පිළිබඳව ස්ථිර නිගමනයකට එළඹී තිබෙන බව ඉටා ගත හැකිය. මෙසේ සකස් වූ ඛුද්දක නිකායට ග්‍රන්ථ පහළොහක් ඇතුළත් වේ.

එනම් :

| | | |
|---|---|---|
| 1. ඛුද්දක පාඨය | 6. විමාන වත්ථු පාළිය | 11. නිද්දේස පාළිය |
| 2. ධම්මපද පාළිය | 7. පේත වත්ථු පාළිය | 12. පටිසම්භිදා මග්ග පාළිය |
| 3. උදාන පාළිය | 8. ථේර ගාථා පාළිය | 13. අපදාන පාළිය |
| 4. ඉති වුත්තක පාළිය | 9. ථේරී ගාථා පාළිය | 14. බුද්ධ වංෂ පාළිය |
| 5. සුත්තනිපාත පාළිය | 10 ජාතක පාළිය | 15. චරිය පිටක පාළිය |

මේ ග්‍රන්ථ පහළොව අතර පළමු වැන්න ඛුද්දක පාඨයයි. ථේරවාද සම්ප්‍රදායට අනුව ඛුද්දක නිකායට ඛුද්දක පාඨය ඇතුළත් වී ඇත. මහායානිකයන්ගේ ඛුද්දක නිකායට ඛුද්දක පාඨය ඇතුළත් වී නැත. ලංකාවෙහි භික්ෂු ශාසනය ඇති වූවායින් පසුව උන්වහන්සේලාගේ අවශ්‍යතාවයන් සඳහා විනය නීති මාලාවක් මෙන් ඛුද්දක පාඨය සකස් වී තිබේ.

ඛුද්දක පාඨයට කරුණු ඇතුළත් කොට ඇත්තේ ඛුද්දක නිකායේ සුත්ත නිපාතයෙනුත් විමානවත්ථු වෙනුත් ප්‍රේතවත්ථු වෙනුත්ය. ග්‍රන්ථ කීපයකින් කරුණු ඇතුළත් වී තිබෙන නිසා ඛුද්දක නිකායේ උද්දකා පාඨ සංග්‍රහයක් සේ ඛුද්දක පාඨය සැලකීමට හැකිය. ඛුද්දක පාඨයට ඇතුළත් කොට ඇත්තේ එදිනෙදා ජීවිතයේදී භික්ෂුනට ප්‍රයෝජනවත් වන කුඩා කරුණු නවයකි.

1. සරණාගමනය
2. දස ශීලය
3. කුමාර ප්‍රශ්නය
4. ද්වත්තිංසාකාරය
5. මංගල සූත්‍රය
6. රතන සූත්‍රය
7. තිරෝකුඩ්ඩ සූත්‍රය

8. නිධිකණ්ඩ සූත්‍රය
9. මෙත්ත සූත්‍රය

මේ කරුණු නවය දෙස විමසා බැලීමේදී ඛුද්දක පාඨය භික්ෂූන් සඳහාම සකස් වූවකැයි කීම සනාථ වේ.

ඛුද්දක පාඨයේ මුලින්ම දක්වා ඇත්තේ සරණාගමනයයි. සරණාගමනයට බුදුදහමේ විශේෂ ස්ථානයක් හිමි වේ. එයට හේතුව බෞද්ධයාගේ මූලික පියවර සරණාගමනය වීමයි. බුදුරජාණන් වහන්සේ බෞද්ධ වූ ගිහියාට අයිතිවන නිත්‍ය ශීලය 'පඤ්ච ශීලය' බව පෙන්වා දී තිබේ. එසේ හෙයින් සරණාගමනය ගිහියාට පමණක් නොව විශේෂයෙන් පැවිද්දාටත් එකසේ බලපායි. එයට හේතුව පැවිදි වීම හා උපසම්පදාව සරණාගමන ගත වීමෙන් පසුව සිදුවීමයි. ඛුද්දක පාඨයේ එය මුලටම යොදා ඇත්තේ එබැවිනි.

මෙහි දෙවැනි වට යොදා ඇත්තේ දස ශීලයයි. සාමණේරයකු විසින් පිළිපැදිය යුතු කරුණු දහයක් එහි විවරණය වෙයි. මෙහිදී භික්ෂුත්වයට මුල් තැනක් දී ඇත. එයට පඤ්ච ශීලය ඇතුළු කිරීමට උත්සාහ කිරීමක් කොට නැත. භික්ෂූන් වහන්සේ ගැන සිතා උන්වහන්සේ වමු උන්වහන්සේලා සඳහාම සලකා තිබේ. පැවිදි වූ පුද්ගලයා අනිවාර්යයෙන්ම සිල්වතෙකු ගුණවතෙකු විය යුතුය. භාවනාවක් වශයෙන් සිතෙහි සමාධිය ඇති කරගැනීම සඳහා ද්වත්තිංසාකාරය ඉදිරිපත් කොට තිබේ. මෙහි අවසාන ප්‍රතිඵලය වනුයේ පිරිසිදු බව නොහොත් චිත්ත සමාධියයි.

අනතුරුව දක්වා ඇත්තේ සාමණේර ප්‍රශ්නයයි. සාමණේර ප්‍රශ්නය ඉදිරිපත් කොට ඇත්තේ ප්‍රඥාව පිළිබඳවයි. සමථ භාවනාවේ අවසාන ප්‍රතිඵලය චිත්ත ශුද්ධිය හෙවත් සමාධියයි. මෙහිදී ප්‍රඥාව වශයෙන් දක්වා ඇත්තේ ලෝක සත්වයා පිළිබඳව තිබිය යුතු අවබෝධයයි. සාමණේර ප්‍රශ්නයේදී පළමු කොටම සබ්බෙ සත්තා ආහාර ට්ඨිතිකා' යනාදී වශයෙන් නාමරූප සඳහා ආහාරය අවශ්‍ය වන බව කියයි. නියම අවබෝධයක් ලද විට සම්මුතිය ඉවත්කර නිවන අවබෝධ කර ගත හැකිය.

සීල - සමාධි - ප්‍රඥා යන ත්‍රිශික්ෂාවට අමතරව භික්ෂූන් වහන්සේ ගිහියා සමග කටයුතු කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය කරන වැදගත් සූත්‍ර ධර්ම කරුණු රාශියකින්ද ඛුද්දක පාඨය සකස් වී තිබීම තවත් වැදගත් ලක්ෂණයකි. මෙහිදී මංගල සූත්‍රයෙන් පිළිපැදිය යුතු ශ්‍රේෂ්ඨ චර්යා ධර්ම රාශියක් උගන්වයි. මෙලොවත් - පරලොවත් යහපත සඳහා ඉවහල් වන ආකාරයට මංගල කරුණු අනුගමනය කළ යුතු බව මංගල සූත්‍රයෙන් උගන්වයි. එම නිසා ගිහි සමාජය සමග කටයුතු කරන විට ඔවුනට අවවාද අනුශාසනා කිරීමට මංගල සූත්‍රය දෙසට පැවිද්දා යොමු කර ඇත.

ගිහියාගේ සෙත ශාන්තිය පිණිසත් තුන් බිය දුරකරගැනීමටත් රතන සූත්‍ර දේශනාව ඉවහල් වේ. තිරෝකුඩ්ඩ සූත්‍රය දක්වා ඇත්තේ මළගිය ඥාතීන්ට පින්පෙත් අනුමෝදන් කර වීමේ චර්යා ධර්ම සමූහයක් වශයෙනි. මළගිය ඥාතීන් ගෙන් තමන්ට වන විපත් වැළැක් වීමටත් පින් අනුමෝදන් කොට ඔවුන් සැපවත් කිරීමටත් එම සූත්‍රයේදී අනුශාසනා කරයි. එසේ පරලොව ගිය ඥාතීන්ට පින් දීම තිරෝකුඩ්ඩ සූත්‍රයෙන් සඳහන් කරමින් දන් දීමෙන් නොහොත් සුචරිත ක්‍රියාවල යෙදීමෙන් බණ භාවනා කිරීමෙන් සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස දක්වා නිධි කණ්ඩ සූත්‍රය නිමවා තිබේ. ඉතා වැදගත් සාරධර්ම පාඨ සංග්‍රහයක් සේද ඛුද්දක පාඨය අගය කළ හැකිය. අනතුරුව දක්වා ඇත්තේ කරණීය මෙත්ත සූත්‍රයයි. කරණීය මෙත්ත සූත්‍රයෙන් මිනිසකු තුළ තිබිය යුතු ගුණ ධර්ම රාශියකුත් එමෙන්ම භික්ෂූන් වහන්සේ උගතුන්ගේ දෝෂ දර්ශණයට ලක් නොවන ලෙස ජීවත් විය යුතු බවද උගන්වයි. කරණීය මෙත්ත සූත්‍රය චතුරාර්‍ය සත්‍ය පිළිබඳව තවත් ආකාරයක ඉගැන්වීමක් යැයිද සැලකිය හැකිය.

ඛුද්දක පාඨය ත්‍රිපිටකයෙහි නොයෙක් තැනින් ගත් වැදගත් කරුණු රාශියකින් සමන්විත කොට රචනය කර ඇත. ඛුද්දක පාඨයෙහි ඇතුළත් කරුණුත් සූත්‍රවල අඩංගු සාර ධර්ම දෙසත් බලන විට ශ්‍රේෂ්ඨ භික්ෂු ජීවිතයක් පෝෂණය සඳහා අවශ්‍ය ලක්ෂණත් නිරවුල් ගිහි ජීවිතයක් සකස් කර ගැනීමටත් උචිත අන්දමින් සකස් වී ඇතැයි කීම නිවරදය.


ආශ්‍රිත ග්‍රන්ථ

ඛුද්ධක නිකාය : ප්‍රථම භාගය
සමන්ත පාසාදිකාව ( බුද්ධඝෝෂ හිමි)
පාලි සාහිත්‍ය (පොල්වත්තේ බුද්ධදත්ත හිමි)